කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානව ශාස්ත්‍ර පීඨය

# ප්‍රතිබිම්බ කලා

## ඡායාරූප කලාව සහ විචාරය IMAT – E 3015

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. කලාව පිළිබඳ විවිධ දාර්ශනිකයින්, විද්වතුන් හා කලාවේදීන් ඉදිරිපත් කොට ඇති මතවාද ඔස්සේ, ඡායාරූප ශිල්පය අද්‍යතන මානව සමාජය තුළ වින්දන මාධ්‍යයක් වශයෙන් යොදාගැනීමට ඇති ඉඩකඩ පරීක්ෂා කරන්න.

02. සම්ප්‍රදායික රසාස්වාද රීතියෙහි අන්තර්ගත කරුණු කවරේ දැයි සඳහන් කොට, ඡායාරූපමය සන්නිවේදනාර්ථ සම්පාදනය පිණිස එහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

03. අධිතාත්විකවාදය (Surrealism) ඡායාරූප කලාව තුළ භාවිත වන්නේ කෙසේ දැයි, එහි සමාරම්භය හා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් විස්තර කරන්න.

04. කෙටි සටහන් ලියන්න.

    i. පත්‍ර කලාරූපී (Journalistic) ඡායාරූප
    ii. ආකෘතික අධ්‍යයනය (Figure Study)
    iii. වාර්තාමය එළඹුම (Documentary approach)
    iv. ෆොටෝෂොප් මෘදුකාංගය
    iv. ජූලියා මාග්‍රට් කැමරොන්

05. **ඇන්සල් ඇඩම්ස්** සහ **එඩ්වඩ් වෙස්ටන්** ඡායාරූප කලාවේ වර්ධනය උදෙසා සපයන ලද දායකත්වය සංසන්දනාත්මකව අගයන්න.

06. අංකිත තාක්ෂණයේ (Digital Technology) ආගමනය හේතුවෙන් ඡායාරූප කලාවේ ඇතිවූ නව ප්‍රවණතා විමසුමට බඳුන් කරන්න.

07. ඡායාරූප ප්‍රදර්ශනවල සමාජීය එලදාව කවරේ දැයි පැහැදිලි කොට, නිර්මාණ ශිල්පීය දායකත්වය අනුව ප්‍රදර්ශන සඳහා සුදුසු වර්ගීකරණයක් යෝජනා කරන්න.

08. ඡායාරූප කලාවේ උන්නතිය සඳහා කැපවන ජාත්‍යන්තර සංවිධානයක් සහ දේශීය සංවිධානයක් ගැන වෙන් වෙන්ව කරුණු දක්වන්න.

**********************************************************